**ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6 | තාක්ෂණික මෘදුකාංග පද්ධති වත්කම් ලෙස හඳුනාගත යුතු අතර එකී දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට වගබලා ගතයුතු වීම. | 1.6.1(අ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු පිරිවැය රු.2,350,000 ක් වූ UNCRC දත්ත පද්ධතිය මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | CIGAS පද්ධතිය හරහා සාරාංශගත වත්කම් ප්‍රකාශය ලබා ගැනීමේදී එම ප්‍රකාශයට UNCRC දත්ත පද්ධතියට අදාල වත්කමේ වටිනාකම එකතු වී නොමැති බව නිරීක්ෂණය වූ අතර මෙය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව. | දත්ත පද්ධතියේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන්, වැය විෂයයන් 4ක ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 මගින් සියයට 40 සිට සියයට 83 අතර පරාසයක මුදල් වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබුණි. තවද, වැය විෂයයන් 4 ක ප්‍රතිපාදන වලින් සියයට 54 සිට සියයට 95 අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පරත්ත ළමා පුහුණු උපදේශන මධ්‍යස්ථානයේ කටයුතු දෙපාර්තමේන්තුව වෙත නැවත පවරා දීමට ප්‍රමාද වීම හා නඩත්තු කටයුතු අවසන් වන තෙක් එම මධ්‍යස්ථානයට ළමුන් ඇතුලත් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සුදුසු තත්ත්වයක නොපැවතීම හේතුවෙන් අපේක්ෂිත වියදම ඇති නොවන ලදී. ඉතිරි වැය විෂයයන් 4 හි වියදම් සීමා කිරීම හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදු වූ බව. | නිසි පුරෝකථනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ 133(ආ) ප්‍රකාරව අප කුඩා දෙපාර්තමේන්තුවක් බැවින් අභ්‍යන්තර විගණනය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය ඒකකය විසින් සිදු කරනු ලබන අතර මු.රෙ 133(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා යොමු කරනු ලබන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලාංකික දරුවන් විදේශ රටවලට දරුකමට හදාවඩා ගැනීම සඳහා 32 දෙනෙකු ලබා දී තිබුණද විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතතෙහි 10C වගන්තිය අනුව හදාවඩා ගැනීම සඳහා ලබාදුන් දරුවන් පිළිබඳව අවුරුදු 10 ක් යනතෙක් අඛණ්ඩව පසුවිපරම් වාර්තා ලබා ගෙන නොතිබුණි. | 10C වගන්තියට අනුව විදේශිකයින්ගෙන් ප්‍රගති වාර්තා ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති බව. | විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතු අතර භාර දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1939 අංක 38 දරන ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත වසර කීපයක සිට සංශෝධනය කරමින් පැවතියද සමාලෝචිත වර්ෂ අවසානයටත් එම ආඥා පනත | පනත සංශෝධනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටු 2ක් පත් කර ඇති අතර එම කමිටු වලට සක්‍රීයව දායක වී අදාළ සංශෝධනයන් | ආඥා පනත් ඇතුළු නීති අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය |

| | | |
|---|---|---|
| සංශෝධනය අවසන් කර නොතිබුණි. තවද, 1941 අංක 24 දරන දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කර නොතිබුණි. | කිරීමට කටයුතු කරමින් පවතින බව. | කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ළමා නිවාස 9 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 5 ක් වෙන්කර තිබුණද 2023 වර්ෂය අවසාන වන විටත්, රු.මිලියන 2.1 ක් පමණ වියදම් කර ළමා නිවාස 4 ක් පමණක් අලුත්වැඩියා කර තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 44 ක් පමණ අවම මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ දෙවන කාර්තුව අවසානයේ මහා භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ පැවති රැස්වීමකදී පළාත් සභා යටතේ පවතින විෂයයන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පළාත් සභාව මඟින් සිදු කරන බැවින් දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන පළාත් සභා යටතේ පවතින විෂයයන් සඳහා වෙන් කිරීම අවශ්‍ය නොවන හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු නොකරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන නිවැරදිව වෙන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ළමා සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල UNICEF මූල්‍යාධාර ලෙස ලැබුණු රු.35,875,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.14,525,271 ක් පමණක් වැයකර තිබීම හේතුවෙන් රු.21,349,728 ක එනම් සියයට 60 ක ඉතිරියක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | විදේශාධාර උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි අයුරින් කාර්යක්ෂමව වැය කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අපයෝජනයට ලක්වන දරුවන්ට පුහුණුව ලබාදීම තුලින් සමාජගත කිරීම සඳහා වන පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය | පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය යථා තත්ත්වයට පත්කිරීම උදෙසා ගොඩනැගිල්ලේ අලුත්වැඩියා | ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය යථා තත්ත්වයට ගැනීම |

| | | | |
|---|---|---|---|
| | සහ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථාන 2ක 2023 ජූනි 06 දින නැවත පවරා ගනු ලැබුවද භෞතික සම්පත් හා අවට පරිසරය යථා තත්වයට පත්කර පුහුණු හා උපදේශන සේවා සැපයීම සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු සිදු කිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන, **ADB** සහ **UNICEF** වෙතින් සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සඳහා කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර ගැනීමට පියවරගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ නිලධාරීන් 60 දෙනෙකුට පමණ පුහුණු වීම් සිදුකළ හැකි වායු සමීකරණය කළ සියළුම පහසුකම් සහිත දේශන ශාලා දෙකක් නිශ්කාර්යව පැවතුණි. | දැනට සැලසුම් කර ඇති අලුත්වැඩියා කටයුතු සිදු කර නැවත එකී මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ අනුව දේශන ශාලා ද නැවත භාවිතයට ගැනීමට කටයුතු කරනු ලබන බව. | කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර 2014 අගෝස්තු මාසයේ සිට ද, පරිවාස නිලධාරී තනතුර 2017 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවතුණි. | නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට හා පරිවාස නිලධාරී තනතුරේ බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අත්‍යවශ්‍ය වන තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |